# ඇදහිය නොහැකි පණිවුඩ බොහෝ විට නිවැරදි නොවේ !



## ලෝක ප්‍රකට සමාගමක් සමග එකතුවී රු.30,000/- කින් විශාල මුදලක් ඉපැයීමට අනගි අවස්ථාවක් !

**ඔබගේ නිවසේ සිටම මසකට රු.25,000/- කට වඩා උපයා ගන්න.**

**රැකියා අවස්ථාව : ලෝක ප්‍රකට සමාගමක බලයලත් නියෝජිතයකු ලෙස, සමාගමේ විශේෂිත නිෂ්පාදන පෙළක් ප්‍රචාරණය.**

**සුදුසුකම් : සාමාන්‍ය පෙළ විෂයයන් 3 ක් සමත්වීම.**

**පෙර රැකියා පළපුරුද්ද අවශ්‍ය නොවේ.**

**ඔබට සමාගමේ භාණ්ඩ ප්‍රචාරණයෙන් සහ ඔබේ මිතුරන් සමාගමට බඳවා ගැනීමෙන් වැඩි මුදලක් උපයා හැකිය.**

## ඉහත පණිවුඩය උදාහරණයක් පමණයි !

**පිරමීඩ වැනි තහනම් ආයෝජන ක්‍රම, විවිධාකාර ලෙස මහජනතාව වෙත ඉදිරිපත් වීමට ඉඩ ඇත.**

**ඔවුන් ඔබව මුලා කරනු පමණක් නොව, ඔබේ පවුලේ සතුට සහ අස්වැසිල්ල නැති කරනු ඇත.**

**ඔබ මහන්සියෙන් උපයාගත් මුදල් ඉතිරි කිරීමට වඩා ආරක්ෂාකාරී සහ සුදුසු ආයෝජන අවස්ථා තෝරා ගන්න!**

**තහනම් පිරමීඩ වැනි ආයෝජන ක්‍රමවල මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.**

- සාමාජිකයන් හෝ ආයෝජන මුදලේ වැඩිවීම මත, ඉහළ ප්‍රතිලාභයක් පොරොන්දු වේ.
- බොහෝවිට ඉතා ඉහළ ප්‍රතිලාභ සහ අනෙක් පහසුකම් පිළිබඳව ව්‍යාජ පොරොන්දු ලබාදේ.
- ඉදිරිපත් කරන භාණ්ඩවලට වෙළෙඳපොළේ හොඳ ඉල්ලුමක් නොමැති අතර, බොහෝවිට ඒවාට ද්විතීය වෙළෙඳපොළක් නොමැත.
- නිෂ්පාදන සඳහා වගකීමක් හෝ අලෙවියෙන් පසු සේවාවක් ලබා නොදේ.
- ආයෝජන ක්‍රමයේ ප්‍රතිලාභ බඳවාගන්නා නව සාමාජිකයන් සංඛ්‍යාව සමඟ වෙනස් වන අතර, ඔවුන් භාණ්ඩ අලෙවි කරන ප්‍රමාණය අනුව වෙනස් නොවේ.
- ඇතුලත්වීමේ ගාස්තුව බොහෝවිට ඉතා ඉහළ අගයක් ගනී.
- සාමාජිකයන් යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ විට, නොවිකිණී ඉතිරි වූ භාණ්ඩ, නැවතත් සමාගම මිලදී ගනු නොලැබේ.
- සමාගමේ ප්‍රධාන අරමුණ භාණ්ඩ අලෙවිය නොව, නව සාමාජිකයන් බඳවා ගැනීම වේ.
- ආකර්ෂණීය ප්‍රතිලාභ ලබාදීමෙන් නව සාමාජිකයන් හදිසියේ බඳවා ගන්නා අතර, ඔවුනට දෙවරක් සිතීමට අවශ්‍ය කාලය ලබා නොදේ.
- සාමාන්‍යයෙන්, සාමාජිකත්වයට බඳවා ගැනීමේදී ඉතා පහසු සහ පළපුරුද්ද හෝ සුදුසුකම් අවශ්‍ය නොවන රැකියා අවස්ථාවක් ලබාදීමක් ලෙස පෙන්නුම් කරයි.
- ඔබගේ විශ්වාසවන්ත මිතුරකු හෝ පවුලේ සාමාජිකයකු ඔබව සාමාජිකත්වයට බඳවා ගැනීමට සාමාන්‍යයෙන් යොදාගනී. ඒ, ඔවුන් මාර්ගයෙන් ලැබෙන ආරාධනාවක් ප්‍රතික්ෂේප කිරීම ඔබට අපහසු බැවිනි.
- ආයෝජන ක්‍රමය පිළිබඳව තොරතුරු, සමාගමේ පිහිටීම, දුරකථන අංක ආදිය සාමාන්‍යයෙන් ලබා නොදේ.

**සටහන : තහනම් වූ පිරමීඩ වැනි යෝජනා ක්‍රම ආරම්භ කිරීම හා ඒවාට සහභාගීවීම නීතිවිරෝධී වේ.**
**එවැනි වරදකට වැරදිකරුවකු වුවහොත් දඩ මුදලක් ගෙවීමට සහ/හෝ සිරදඬුවම් අත්විඳීමට සිදුවේ.**


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**වැඩිදුර විස්තර දැනගැනීම සඳහා දුරකථන:** 2477100, 2477120, 2477129, 2398539
**ෆැක්ස්:** 2477711 **විද්‍යුත් තැපෑල:** banksup@cbsl.lk